කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)-2014/15

2020 - අගෝස්තු

**BCOM E 3063 - බදුකරණය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහයි : (05) කාලය : පැය 03 යි

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

2018/2019 තක්සේරු වර්ෂයට අදාලව ආදායම් බදු ගණනය සඳහා පෙරේරා මහතාට අදාල තොරතුරු ඔබට ලබා දී ඇත. ඔහු විසින් 2014/15 වර්ෂයේදී ආරම්භ කරන ලද, මිලට ගැනීම් හා විකිණීම් තනිපුද්ගල ව්‍යාපාරයක නිරත වේ.

1. ව්‍යාපාරයට අදාල තොරතුරු

   i. 2019 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා බදු පෙර ශුද්ධ ලාභය රු. 5,400,000 කි. පසුගිය වසරේ ශුද්ධ ලාභය රු. 4,590,000 ක් ලෙස වාර්තා විය.
   ii. ව්‍යාපාරයේ ක්ෂය විදයම රු.570,000 කි. 2017/2018 දී රු. 2,000,000 කට ඉදිකරන ලද ගොඩනැගිල්ල සහ 2016/2017 දී රු. 1,800,000 කට මිලට ගත් මෝටර් වෑන් රථය ප්‍රාග්ධන දීමනා සඳහා සැලකිය යුතුය.
   iii. ස්ථාවර තැන්පතු මත රු. 150,000 ක පොළියක් (ශුද්ධ) බැංකුවෙන් රඳවා ගැනීමේ බදු සහතික පත් ද සමඟ ලැබුණි.
   iv. ලද වට්ටම් - රු. 100,000
   v. ව්‍යාපාරික ශුද්ධ ලාභය ගණනයේදී පහත වියදම් ද අඩු කොට ඇත.

| | රු. |
|---|---|
| ප්‍රචාරණය | 67,500 |
| වේතන, සේ.අ.අ,සේ.භා.අ | 1,350,000 |
| රජයේ පාසලකට පරිත්‍යාග | 75,000 |
| නෛතික වියදම් (සටහන 1) | 105,000 |
| විදේශ ගමන් (සටහන 2) | 300,000 |
| අඩමාණ ණය වෙන්කිරීම් | 150,000 |
| පාරිතෝෂිත වෙන්කිරීම් (සටහන 3) | 150,000 |
| දඩ | 30,000 |
| වෘත්තිමය ගාස්තු (සටහන 4) | 330,000 |

| සටහන 1 - නෛතික ගාස්තු | රු. |
|---|---|
| ණය අයකර ගැනීම් සඳහා | 75,000 |
| පාරිසරික රෙගුලාසි සමඟ අනුකූලතා නොවීම් සඳහා | 30,000 |
| | 105,000 |

සටහන 2 - විදේශ ගමන්
පෙරේරා මහතා ගේ පවුලේ සවාරියකට බැංකොක් යාම සඳහා දරා ඇත.

සටහන 3 - පාරිතෝෂිත සඳහා වෙන්කිරීම්
පාරිතෝෂිත වෙන්කිරීම් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන් පිළිවෙලින් රු. 75,000 සහ රු. 165,000 වේ.

| සටහන 4 - වෘත්තිමය ගාස්තු | රු. |
|---|---|
| ගිණුම්කරණ කටයුතු සඳහා ගෙවීම් | 180,000 |
| විගණක ගාස්තු | 150,000 |
| | 330,000 |

2. පෙරේරා මහතාගේ ව්‍යාපාරයට අදාල ඉහත තොරතුරු වලට අමතරව, ඔහුගේ පෞද්ගලික ගණුදෙනු පිළිබඳ තොරතුරුද ඔබට සපයා ඇත.

- වර්ෂය තුලදී සීමිත කොටදර සමාගමෙන් රු. 40,500 (ශුද්ධ) ලාභාංශ පෙරේරා මහතාට ලැබී ඇත.
- ඔහු විසින් ඔහුගේ නිවාස වලින් එකක් රු. 45,000 ක මාසික කුලියකට කුලියට දී ඇත. ඔහු රු. 67,500 ක් එහි අළුත්වැඩියා හා නඩත්තු වියදම් ලෙස දරා ඇත. කුලි නිවැසියා විසින් සලකා බලන වර්ෂයට අදාල සියලු කුලි නියමිත ලෙස ගෙවා ඇත.
- පෙරේරා මහතා රු. 600,000 ක ලොතරැයි දිනුමක් ලබා ඇත.
  ඔබ විසින් 2018/2019 තක්සේරු වර්ෂය සඳහා පෙරේරා මහතාගේ ආදායම් බදු වගකීම ගණනය කරන්න.

(මුළු ලකුණු 35 )

ප්‍රශ්න අංක - 02

ගමගේ මහතා සීමිත සෙරොක්ස් සමාගමේ ගණකාධිකාරිවරයා වශයෙන් සේවය කරයි. ඔහු විසින් 2018/2019 තක්සේරු වර්ෂයට අදාලව සේවානියුක්තිය තුලින් පහත ප්‍රතිලාභ ලබා ඇත.

- මාසික වේතනය - රු. 225,000
- දීමනා - මසකට රු. 30,000
- සමාගමේ සියළු සේවකයන් සමව බලපාන වෛද්‍ය රක්ෂණ ක්‍රමය මගින් ඔහුගේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය - රු. 50,000
- සමාගම විසින් එන්ජින් ධාරිතාව 1300 ට දෙමුහුන් මෝටර් රථයක් ඉන්ධන ද සමඟ ඔහුට සපයා ඇත.
- සමාගම විසින් ගමගේ මහතාට ගෘහභාණ්ඩ රහිත නිවසක් ලබා දී ඇති අතර ඔහු 2019 මාර්තු 31 න් අවසන් වර්ෂය තුල එහි පදිංචි වී සිට ඇත. එම නිවස වරිපණම් සීමාවක් තුල පිහිටා තිබුණි. ගමගේ මහතා විසින් මසකට රු. 7500 බැගින් කුලියක් සමාගමට ගෙවා ඇත.

- 2018 අප්‍රේල් 1 දින ගමගේ මහතා විසින් 5 % ක සහන පොළී අනුපාතයකට යටත්ව රු. 1,000,000 ක ණය මුදලක් සමාගමින් ලබා ගෙන ඇත.
- සමාගම විසින් රු. 225,000 ක ප්‍රසාද දීමනාවක් වර්ෂය තුල ගෙවා ඇත. මෙය සමාගමේ පසුගිය වසරේ ලාභ සඳහා අදාල වේ.

ඔබ විසින් 2018/19 තක්සේරු වර්ෂය සඳහා ගමගේ මහතාගේ බද්දට යටත්වන සේවානියුක්ත ආදායම ගණනය කරන්න.

(මුළු ලකුණු 20 )

ප්‍රශ්න අංක - 03

තේනුවර මහතා වසර 30 ක සේවාකාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 2019 පෙබරවාරි මාසය අවසානයේ සීමිත දෝරා (පොදු) සමාගමේ සේවයෙන් විශ්‍රාම යන ලදී. ඔහු 2019 මාර්තු මාසය තුල පහත විශ්‍රාම ප්‍රතිලාභ ලබා ඇත.

- විශ්‍රාම පාරිතෝෂිතය - රු. 6,750,000
- සේවක අර්ථසාධක අරමුදල ( EPF)
  තම දායකත්වය - රු. 9,900,000
  සේවා යෝජකයාගේ දායකත්වය - රු. 6,600,000
  ආයෝජන ආදායම - රු 1,875,000
- සේවක භාරකාර අරමුදල (ETF)
  සේවා යෝජකයාගේ දායකත්වය - රු. 1,400,000
  ආයෝජන ආදායම - රු. 330,000
- තේනුවර මහතා විසින් තම සේවාකාලයේ පරිහරණය කරන ලද මෝටර් රථය සමාගම විසින් ඔහු විශ්‍රාම යාමේ දී ත්‍යාගයක් ලෙස ලබා දී ඇත. මෝටර් රථයේ වෙළඳපල අගය රු. 3,000,000 ක් විය.

ඔබ විසින් පහත දෑ ගණනය කළ යුතුය.

අ. අඩු අනුපාත යටතේ බද්දට යටත් වන විශ්‍රාම ප්‍රතිලාභ
(ලකුණු 07)

ආ. බද්දට යටත් නොවන විශ්‍රාම ප්‍රතිලාභ
(ලකුණු 05)

ඇ. අඩු අනුපාත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ මත ගෙවිය යුතු බද්ද.
(ලකුණු 03)

(මුළු ලකුණු 15)

ප්‍රශ්න අංක - 04

අ. 2017 අංක 24 දරණ ආදායම් බදු පනතට අනුව "ආයෝජන ආදායම" යන්න නිර්වචනය කරන්න.
(ලකුණු 03)

ආ. පහත තොරතුරු 2018/19 කාලච්ඡේදය සඳහා ප්‍රනාන්දු මහතාට අදාල වේ.

i. 2019 ජනවාරි 25 දින ප්‍රනාන්දු මහතා විසින් ඔහුගේ සීමිත සේරා ලයිස්තුගත සමාගමෙහි කර තිබූ මිලියන 1.5 ක කොටස් ආයෝජනයෙන් 75% ක් වෙනත් ආයෝජකයෙකුට එකක් රු. 30 බැගින් විකිණූ අතර, ඉතිරිය ඔහුගේ බිරිඳට මාරුකරන ලදී. ඔහු විසින් මෙම කොටස් මීට වසර 4 කට පෙර එකක් රු. 20 බැගින් මිලදී ගෙන ඇත.

ii. 2018 ඔක්තොම්බර් 30 දින ඔහු විසින් ඔහුගේ තට්ටු නිවසක් විකුණන ලදී. ඔහුට මෙම නිවස 2017.12.01 දින ඔහුගේ පියාගේ මියයාමත් සමග ලැබී ඇත. ඔහුගේ පියා මෙම නිවස 2017.10.30 දින රු. මිලියන 6 කට මිලට ගෙන ඇති අතර ඔහු මිය යන විට එහි වෙළඳපල වටිනාකම රු. මිලියන රු. 75 ක්ව පැවතුණි.

iii. ප්‍රනාන්දු මහතා විසින් සීමිත මිහිදු (පුද්ගලික) සමාගමේ කොටස් රු. 750,000 කට මිලට ගෙන ඇත. ඔහු 2019.02.01 දින මෙම කොටස් රු. 900,000 කට විකුණා ඇත.

ඔබ විසින් 2018/2019 තක්සේරු වර්ෂයට අදාලව ඉහත ගණුදෙනු මගින් පැන නගින බදු වගකීම් පිළිබඳ ප්‍රනාන්දු මහතාට උපදෙස් ලබා දෙන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 15)

ප්‍රශ්න අංක - 05

අ. ආදායම් බදු මූලධර්ම ලැයිස්තුගත කොට ඉන් 02 ක් පහදන්න.

(ලකුණු 05)

ආ. නේවාසික පුද්ගලයෙකුගේ බදු වගකීම නිර්නේවාසික පුද්ගලයෙකුගේ බදු වගකීමෙන් වෙන්කොට දක්වන්න.

(ලකුණු 05)

ඇ. 2017 අංක 24 දරණ ආදායම් බදු පනතට අනුව "පුද්ගලයා" යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 15)